58486

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2018

2018.08.09/ 0830 - 1030

# ව්‍යාපාර අධ්‍යයනය I
# வணிகக் கல்வி I
# Business Studies I

32 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලි ව සටහන් කරන්න.
* ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
* ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
* සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය : ..................................

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| I පත්‍රය සඳහා | |
|---|---|
| **ප්‍රශ්න අංක** | **ලකුණු** |
| 01 - 30 | |
| 31 - 50 | |
| **එකතුව** | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

**1.** මිනිස් අවශ්‍යතා හා වුවමනා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) පුද්ගලයෙකුට අවශ්‍යතා අසීමිත ප්‍රමාණයක් ඇති අතර වුවමනා ඇත්තේ සීමිත ප්‍රමාණයක් වේ.
(2) ව්‍යාපාරිකයකුට අවශ්‍යතා නිර්මාණය කළ හැකි අතර වුවමනා නිර්මාණය කළ නොහැකි වේ.
(3) අවශ්‍යතා පොදුවන අතර වුවමනා පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.
(4) ආදරය, ආහාර, ආරක්ෂාව, කාර්මික අධ්‍යාපනය අවශ්‍යතාවලට නිදසුන් කිහිපයක් වේ.
(5) වුවමනා තෘප්තිමත් කර ගැනීමට පුද්ගලයෙකු යම් නිෂ්පාදිතයක් තෝරා ගැනීම අවශ්‍යතාව වේ. (......)

**2.** ඕනෑම සංවිධානයකට පොදු **නොවන** ලක්ෂණයක් වන්නේ,
(1) සම්පත් භාවිතා කිරීම ය.
(2) මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉටු කිරීම ය.
(3) භාණ්ඩ හෝ සේවා සැපයීම ය.
(4) ලාභ ඉපැයීමේ අභිප්‍රායක් තිබීම ය.
(5) රජයේ ප්‍රතිපත්ති හා නීතිරීතිවලට අනුගත වීම ය. (......)

**3.** නිෂ්පාදිත වර්ගීකරණයේ ගලායෑම හා එයට අදාළ උදාහරණය නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක් ද?
(1) ස්පෘශ්‍ය → භාණ්ඩ → කල් නොපවතින - මෝටර් වාහන
(2) ස්පෘශ්‍ය → භාණ්ඩ → පාරිභෝගික සේවා - ප්‍රවාහනය
(3) අස්පෘශ්‍ය → සේවා → ඍජු සේවා - බැංකු
(4) අස්පෘශ්‍ය → භාණ්ඩ → භාවිතය අනුව - ගෘහ භාණ්ඩ
(5) ස්පෘශ්‍ය → භාණ්ඩ → භාවිතය අනුව - රක්ෂණය (......)

**4.** ව්‍යාපාර පරිසර බලවේග, සාධක හා ඒවායේ බලපෑම නිවැරදිව සඳහන් කර ඇති ප්‍රකාශය කුමක් ද?
(1) ව්‍යාපාරයක පරිගණක ක්‍රියාකරුවන් අභ්‍යන්තර සාධකයක් වන අතර ඔවුන්ගේ කුසලතා අඩුකම ව්‍යාපාරයට තර්ජනයක් වේ.
(2) තරගකරුවන් වැඩි වීම ව්‍යාපාරයට තර්ජනයක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ.
(3) විදේශ විනිමය අනුපාතය පහත වැටීම අපනයනකරුවන්ට අවස්ථාවක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ.
(4) මූල්‍ය ආයතන සාර්ව පරිසර බලවේගයක් වන අතර ඔවුන්ගේ දැඩි තරගකාරිත්වය ව්‍යාපාරවලට අවස්ථාවක් වේ.
(5) සංවිධාන ව්‍යුහය තුළ සන්නිවේදනය නිසි පරිදි සිදු වීම සංවිධානයට ශක්තියක් වන අතර එය ආසන්න බාහිර පරිසර බලවේගයක් වේ. (......)

[ බලන්න. පිටුව බලන්න.

HELPMATE
www.ehelpmate.com

**5.** පාරිභෝගික ආරක්ෂණය තුළින් ලැබෙන ප්‍රතිලාභ කිහිපයක් පහත දැක්වේ.

A - ගෙවන මුදලට සරිලන වටිනාකමක් ඇති භාණ්ඩ පරිභෝජනය කිරීමට හැකි වීම
B - පාරිභෝගික විශ්වාසය දිනා ගැනීමට හැකි වීම
C - භාණ්ඩයේ ප්‍රවර්ධන පිරිවැය අඩු කර ගැනීමට හැකි වීම
D - භාණ්ඩයේ ප්‍රමිතිය තහවුරු කර ගැනීමට හැකි වීම
E - විකුණුම් පිරිවැටුම වැඩි කර ගැනීමට හැකි වීම
F - වෙළෙඳ විෂමාචාරවලට එරෙහි වීමට හැකි වීම

ඉහත දෑ අතුරෙන් ව්‍යාපාරිකයකුට පමණක් ලැබෙන ප්‍රතිලාභ ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ABC (2) ADF (3) BCE (4) BCF (5) BDF (……)

**6.** නිමල් හා කමල් හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන නමුත් ඔවුන් අතර හවුල් ගිවිසුමක් නොතිබුණි. පසුගිය වසරේදී ඔවුන් විසින් යෙදූ ප්‍රාග්ධනයට මෙන්ම අමතරව යෙදූ ණය මුදල්වලට ද 5% ක පොලියක් ලබාගෙන ඇති අතර නිමල් තම මිතුරෙකු වූ සුනිල්ව හුදෙක් සිය කැමැත්ත මත පමණක් හවුල්කරුවෙකු ලෙස සම්බන්ධ කර ගන්නා ලදී. කමල් ප්‍රධාන විධායක නිලධාරි වශයෙන් තමන්ට දැනට ලැබෙන වැටුප ප්‍රමාණවත් නොවන බව පවසා එය වැඩි කිරීමට ඉල්ලීමක් කර ඇත.
ඉහත සිද්ධියේ දැක්වෙන පරිදි මෙම හවුල් ව්‍යාපාරය හවුල් ව්‍යාපාර ආඥා පනතට අනුව උල්ලංඝනය කර ඇති කොන්දේසි ගණන කොපමණ ද?
(1) එකකි. (2) දෙකකි. (3) තුනකි. (4) හතරකි. (5) කිසිවක් නැත.(……)

**7.** ඇපයෙන් සීමිත සමාගමක ලක්ෂණයක් **නොවන්නේ**,
(1) මහජනතාවට කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම ය.
(2) අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකුවත් සිටීම ය.
(3) ලාභාංශ බෙදාහැරීමක් සිදු නොකිරීම ය.
(4) ලාභ අභිප්‍රායෙන් ආරම්භ කිරීම ය.
(5) සමාගම ඈවර කිරීමේදී එක් එක් සාමාජිකයා දායක විය යුතු මුදල සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කිරීම ය. (……)

**8.** සමුපකාර සමිතියක් ලියාපදිංචි කිරීමේදී සමුපකාර සංවර්ධන කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය **නොවන්නේ**,
(1) අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක් ය.
(2) යෝජිත ආර්ථික කටයුතුවල යෝග්‍යතා වාර්තාව ය.
(3) යෝජනා සම්මත වූ වාර්ෂික මහා සභා වාර්තාව ය.
(4) සමිතිය පිහිටි ස්ථානයට ළඟාවන මාර්ග සිතියම ය.
(5) ඉල්ලුම් පත්‍රයට අත්සන් තැබූ සාමාජිකයින්ගේ පෞද්ගලික තොරතුරු ය. (……)

**9.** සිසිල් විධිමත් සැලසුම්කරණයට වඩා තම හැකියා මත විශ්වාසය තබා ඇති අතර අසීරු කාර්යයක් වුවත් ආරම්භ කර අඛණ්ඩව ක්‍රියාත්මක කරගෙන යාමට හැකියාවක් ඇත්තෙකි. ඔහු ව්‍යාපාරයේ පරමාර්ථ ඉටු කර ගැනීමට නව අදහස් මත කටයුතු කරයි.
ඉහත තොරතුරු අනුව සිසිල් සතු ව්‍යවසායකත්ව නිපුණතා සංඛ්‍යාව,
(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (……)

**10.** සුළු පරිමාණ ව්‍යාපාර අසාර්ථක වීමට බලපානු ලබන සාධක කිහිපයක් පහත දැක්වේ.

A - දැඩි තරගකාරිත්වය
B - නිවැරදිව ගිණුම් පවත්වාගෙන නොයෑම
C - යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
D - නිවැරදි සේවකයින් බඳවා නොගැනීම
E - නව නිෂ්පාදිත කරා යොමු නොවීම
F - කර්මාන්තයේ නිෂ්පාදන තාක්ෂණය වෙනස් වීම
G - ව්‍යාපාර කාර්යඵල විශ්ලේෂණය නොකිරීම
H - රජයේ බදු සහන අඩු කිරීම

ඉහත දෑ අතුරෙන් සුළු පරිමාණ ව්‍යවසායකයකුට පාලනය කළ හැකි සාධක පමණක් ඇතුළත් පිළිතුර කුමක් ද?
(1) ACEH (2) ACFH (3) BCDG (4) BDEF (5) BDEG (……)



eHELPMATE
www.ehelpmate.com

**11.** මෙහි දැක්වෙන වගුවේ **X** තීරුව මගින් විවිධ මුදල් වර්ග ද, **Y** තීරුව මගින් ඊට අදාළ නිදසුන් කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. විද්‍යුත් මුදල් | 1. භාණ්ඩාගාර බිල්පත |
| B. ආසන්න මුදල් | 2. රත්‍රං |
| C. ව්‍යවහාර මුදල් | 3. ඉල්ලුම් තැන්පත් |
| D. බැංකු මුදල් | 4. කාසි හා නෝට්ටු |
| E. ද්‍රව්‍ය මුදල් | 5. ණය කාඩ්පත් |

මුදල් වර්ග හා උදාහරණ නිවැරදිව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5
(2) A-2, B-4, C-3, D-1, E-5
(3) A-2, B-1, C-4, D-3, E-5
(4) A-5, B-3, C-4, D-1, E-2
(5) A-5, B-1, C-4, D-3, E-2 (......)

**12.** වාණිජ බැංකුවක් මගින් ලබාගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් කිහිපයක් පහත දැක්වේ.

A - පොලියක් ලබා ගැනීමට හැකි වීම
B - චෙක්පත් තැන්පත් කිරීමට හැකි වීම
C - නිත්‍ය නියෝග මත ගෙවීම් කළ හැකි වීම
D - ණයපත් ලබා ගැනීමට හැකි වීම
E - අයිරා පහසුකම් ලබා ගැනීමට හැකි වීම

ඉහත ද අතුරෙන් ඉතිරිකිරීමේ ගිණුම් හිමියෙකුට ලබා ගත හැකි ප්‍රතිලාභ හා පහසුකම් ගණන,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**13.** බණ්ඩාර ඔහුගේ මෝටර් රථය සඳහා තෙවෙනි පාර්ශ්ව රක්ෂණයක් ලබා ගෙන තිබුණි. ඔහුගේ පුතා විසින් එම වාහනය පදවාගෙන යන අවස්ථාවකදී එය නිවසක වැදී වාහනයටත් එම නිවසටත් අලාභහානි සිදු වූ අතර පුතාට ද තුවාල සිදු විය.

ඉහත සිද්ධිය අනුව රක්ෂණ වන්දි ලබාගත හැකි වන්නේ,

(1) වාහනයට පමණි. (2) නිවසට පමණි. (3) පුතාට පමණි.
(4) වාහනයට හා නිවසට පමණි. (5) නිවසට හා පුතාට පමණි. (......)

**14.** බිමල් කථා පැවැත්වීමට කැමති අයෙකි. ඔහුගේ කථා සාමාන්‍යයෙන් දිගු ය. ඔහු කථාවේදී බැරෑරුම් වචන පාවිච්චි කරන අතර සමහර විට පුද්ගලයින්ට ද අපහාස කරයි. ඔහු තමාගේ මතය දැඩි විශ්වාසයකින් ඉදිරිපත් කරන නමුත් ඇතැම් තොරතුරු සාවද්‍ය වේ. කෙසේ වුවත් ඔහුගේ කථා විලාසය සිත් ඇදගන්නා සුළු ය.

ඉහත විස්තර අනුව බිමල් විසින් කඩකරන්නා වූ සඵලදායී සන්නිවේදනයක ගුණාංග සංඛ්‍යාව,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**15.** පහත වගුවේ **X** තීරුවේ විද්‍යුත් මාධ්‍ය හරහා කරනු ලැබූ ව්‍යාපාර ක්‍රියාකාරකම් කිහිපයක් ද, **Y** තීරුවේ විද්‍යුත් වෙළෙඳ ආකෘති කිහිපයක් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A - ආගමන විගමන දෙපාර්තමේන්තුව විදේශ ගමන් බලපත් සඳහා ඉල්ලුම් පත් භාර ගැනීම | 1. B2 C |
| B - **M** සමාගම **S** සමාගමට සහල් තොග අලෙවි කිරීම | 2. C2 C |
| C - ගුවන් ගමන් නියෝජිතයෙකු විසින් සමන්ට ගුවන් ටිකට්පතක් අලෙවි කිරීම | 3. B2 G |
| D - සීමාසහිත **A** සමාගම රාජ්‍ය සංස්ථාවකට පරිගණක සැපයීම | 4. G2 C |
| E - **R** විසින් තමාගේ ඉඩම **D** නමැති පුද්ගලයාට විකිණීම | 5. B2 B |

විද්‍යුත් ව්‍යාපාර ක්‍රියාකාරකම් හා විද්‍යුත් වෙළෙඳ ආකෘති නිවැරදි ලෙස ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5 (2) A-2, B-4, C-3, D-1, E-5
(3) A-3, B-5, C-1, D-4, E-2 (4) A-4, B-5, C-1, D-3, E-2
(5) A-5, B-4, C-1, D-2, E-3 (......)

**16.** කළමනාකරණයට හා කළමනාකරණ ක්‍රියාවලියේ කාර්යයන්ට (functions) අදාළ **වඩාත්** නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) කිසියම් ගැටලුවකට ගනු ලැබූ නිශ්චිත විසඳුමක් ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'කළමනාකරණය' වේ.
(2) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටු කර ගැනීමට ගනු ලබන පියවර ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය 'සැලසුම්කරණය' වේ.
(3) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීමට සම්පත් බෙදාහැරීමේ ක්‍රියාවලිය 'සංවිධානකරණය' වේ.
(4) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවකයින්ට බලපෑම් කිරීමේ ක්‍රියාවලිය 'මෙහෙයවීම' වේ.
(5) ආයතනයක පරමාර්ථ හා අරමුණු ඉටුකර ගන්නා ආකාරයට, සැලසුම්ගත හා සත්‍ය ප්‍රතිඵල අතර වෙනස්කම් නිවැරදි කිරීමට පියවර ගැනීමේ ක්‍රියාවලිය 'පාලනය' වේ. (......)

[ හතරවැනි පිටුව බලන්න.

eHELPMATE
www.ehelpmate.com

**17.** පහත වගුවේ **X** තීරුව මගින් තීරණ ගැනීමේ පියවර ද, **Y** තීරුව මගින් කිසියම් ආයතනයකට සම්බන්ධව එම පියවරවලට අදාළ තොරතුරු ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. ගැටලුව හඳුනා ගැනීම | 1. සේවා ප්‍රවර්ධන අංශයක් ස්ථාපිත කිරීම |
| B. විකල්ප විසඳුම් හඳුනා ගැනීම | 2. අලෙවියෙන් පසු සේවා සැපයුම් ප්‍රවර්ධනය |
| C. විකල්ප ඇගයීම | 3. විවිධ පාර්ශ්වයන්ගෙන් යෝජනා කැඳවීම |
| D. හොඳම විකල්පය තෝරා ගැනීම | 4. පාරිභෝගික වුවමනා තෘප්තිමත් කිරීමට අපොහොසත් වීම |
| E. තීරණය ක්‍රියාත්මක කිරීම | 5. දෙන ලද යෝජනා කළමනාකරණ කමිටුවක විශ්ලේෂණය කිරීම |

තීරණ ගැනීමේ පියවර හා ඊට අදාළ තොරතුරු නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-2, C-4, D-3, E-5 (2) A-2, B-1, C-3, D-5, E-4
(3) A-4, B-3, C-5, D-2, E-1 (4) A-4, B-2, C-3, D-1, E-5
(5) A-5, B-1, C-4, D-3, E-2 (……)

**18.** ඉවත්ව යාමේ සම්මුඛ පරීක්ෂණයේදී කළමනාකරුවෙකු විසින් ඉදිරිපත් කළ ප්‍රකාශය අනුව ඔහු ආයතනයෙන් ඉවත්වීමට බලපෑ ප්‍රධාන හේතුව වන්නේ, වැටුප ප්‍රමාණවත් නොවීම, විශාල සේවක සංඛ්‍යාවකගේ වැඩ අධීක්ෂණය කිරීමට සිදු වීම, එකවර විවිධ පාර්ශ්වයන්ගෙන් විධාන ලැබීම, තීරණ ගැනීමට නිදහසක් නොමැති වීම හා අවිධිමත් සම්බන්ධතා ප්‍රබල වීම හේතුවෙන් විධිමත් අධිකාරිත්වය ස්ථාපිත නොවීම වැනි කරුණු නිසා ඇති වූ මානසික ආතතියයි.

ඉහත ප්‍රකාශයට අනුව මෙම ආයතනයේ සංවිධානකරණයට අදාළ දුර්වලතා සංඛ්‍යාව,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (……)

**19.** 'ක්‍රියාවලි පිරියත' යන්න නිවැරදිව විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.

(1) සමාන ශ්‍රිත හෝ ක්‍රියාවලි පදනම් කරමින් සිදු කරන පිරියතයි.
(2) නිෂ්පාදන කාර්යයන් රේඛීයව ගලා යන ක්‍රමයට පදනම්ව සකස් වී ඇති පිරියතයි.
(3) කොටසක් රේඛීයව ගලා යන ක්‍රමයටත්, තව කොටසක් නම්‍ය ලෙස ගලා යන ක්‍රමයටත් පදනම්ව සකස් වී ඇති පිරියතයි.
(4) සමාන යන්ත්‍ර හා විෂම යන්ත්‍ර වෙන වෙන ම කුටිවල සවි කර සකස් වී ඇති පිරියතයි.
(5) නිෂ්පාදනය සිදු කරන නිශ්චිත ස්ථානයට සියලුම උපකරණ හා අවශ්‍ය සෙසු ද්‍රව්‍ය ගෙනවිත් සකස් කෙරෙන පිරියතයි. (……)

**20.** පහත සඳහන් වන්නේ තොග සම්බන්ධ වියදම් කිහිපයකි.

A - ගබඩා වියදම් E - පරීක්ෂා කිරීමේ වියදම්
B - තොග හානිවීම් F - ආරක්ෂක වියදම්
C - රක්ෂණ ගාස්තු G - මිල දී ගැනීමේ පිරිවැය
D - ගෙන ඒමේ වියදම් H - තොග හිඟ වීමේ පිරිවැය

ඉහත සඳහන් ඇ අතුරෙන් තොග පවත්වා ගැනීමට අදාළ වියදම් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABCF (2) ABCH (3) BCDE (4) BCFH (5) CDEG (……)

**21.** පහත දැක්වෙන්නේ ඵලදායිතාව වැඩි කර ගැනීමට අනුගමනය කළ හැකි යැයි කළමනාකරුවන් විසින් අදහස් කෙරෙන ක්‍රම කිහිපයකි.

A - නව තාක්ෂණය භාවිත කිරීම E - නිෂ්පාදිත විවිධාංගීකරණය කිරීම
B - සහභාගීත්ව තීරණ ගැනීම හඳුන්වා දීම F - සේවක සුභසාධන වියදම් අඩු කිරීම
C - සේවක කප්පාදුව G - නිෂ්පාදිතවල ලාභාන්තිකය වැඩි කිරීම
D - සම්පත් නාස්තිය අවම කිරීම

ඉහත ඇ අතුරෙන් ඵලදායිතාව වැඩි කර ගැනීමට යෝග්‍ය **නොවන** ක්‍රම මොනවා ද?

(1) ABC (2) CDE (3) CFG (4) DEF (5) DFG (……)

**22.** ආයුර්වේදීය දන්තාලේප නිෂ්පාදකයකුගේ අදහස අනුව සිය නිෂ්පාදිත ස්වාභාවික වර්ණයකින්, රසයකින්, පෙනුමකින් මෙන් ම ඉහළ ගුණත්වයකින් ද සමන්විත විය යුතු ය. මෙම අදහසට වඩාත් ම ගැළපෙන අලෙවිකරණ සංකල්පය කුමක් ද?

(1) නිෂ්පාදන සංකල්පය (2) නිෂ්පාදිත සංකල්පය (3) විකුණුම් සංකල්පය
(4) අලෙවිකරණ සංකල්පය (5) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පය (……)

[පස්වැනි පිටුව බලන්න.

HELPMATE
www.ehelpmate.com

**23.** පහත දැක්වෙන්නේ මූල්‍ය අනුපාත කිහිපයක් ගණනය කරනු ලබන ආකාර වේ.

A - ආයෝජන මත ප්‍රතිලාභ අනුපාතය = $\frac{\text{බදු පසු ශුද්ධ ලාභය + පොලිය}}{\text{ස්ථාවර වත්කම්}} \times 100$

B - හිමිකම් ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ අනුපාතය = $\frac{\text{බදු පසු ශුද්ධ ලාභය + වරණීය ලාභාංශ}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}} \times 100$

C - මුළු වත්කම් පිරිවැටුම් අනුපාතය = $\frac{\text{විකුණුම්}}{\text{මුළු වත්කම්}}$

D - ණයගැති පිරිවැටුම් අනුපාතය = $\frac{\text{විකුණුම්}}{\text{සාමාන්‍ය ණයගැතියෝ}}$

E - ජංගම අනුපාතය = $\frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$

ඉහත දෑ අතුරෙන් නිවැරදිව ගණනය කර ඇති අනුපාත ගණන,

(1) 1 කි. (2) 2 කි. (3) 3 කි. (4) 4 කි. (5) 5 කි. (......)

**24.** පහත වගුවේ **X** තීරුව මගින් කොළඹ කොටස් හුවමාරුවේ ගනුදෙනු වන සුරැකුම්පත් වර්ග කිහිපයක් ද, **Y** තීරුව මගින් ඒවා සඳහා ලැබෙන ප්‍රතිලාභ ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. සාමාන්‍ය කොටස් | 1. ප්‍රාග්ධන ලාභ ලබා ගැනීමට හැකි වීම |
| B. වරණීය කොටස් | 2. ස්ථිර පොලී ප්‍රතිශතයක් හිමි වීම |
| C. කොටස් බලපත්‍ර | 3. සමාගමේ අයිතිය හිමි වීම |
| D. සාංගමික ණයකර | 4. ආයෝජනයට වැඩි ආරක්ෂාවක් ලැබීම |
| E. රජයේ ණය සුරැකුම්පත් | 5. ස්ථිර ලාභ ප්‍රතිශතයක් ලැබීම |

සුරැකුම්පත් වර්ග හා ප්‍රතිලාභ නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

(1) A-1, B-3, C-2, D-4, E-5
(2) A-3, B-2, C-1, D-5, E-4
(3) A-3, B-5, C-1, D-2, E-4
(4) A-2, B-3, C-1, D-5, E-4
(5) A-4, B-5, C-2, D-1, E-3 (......)

**25.** මානව සම්පත් කළමනාකරණයට අදාළ **වඩාත්** නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) නිශ්චිත අරමුණක් ඉටු කිරීම සඳහා ආයතනයේ වැඩ ඒකකවලට බෙදීම රැකියා නිර්මාණය වේ.
(2) රැකියාවක ලක්ෂණ පිළිබඳව ක්‍රමානුකූල අධ්‍යයනයක් කිරීම රැකියා විශ්ලේෂණය වේ.
(3) සේවකයකුගේ සුදුසුකම් විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා විස්තරය වේ.
(4) කිසියම් රැකියාවක් තුළ පවතින ගුණාංග විස්තර කෙරෙන ප්‍රකාශය රැකියා පිරිවිතරය වේ.
(5) රැකියා පිරිවිතරය හා රැකියා විස්තරය සකස් කිරීමට පදනම් වන්නේ රැකියා විශ්ලේෂණය වේ. (......)

**26.** සේවක ආකර්ෂණ ක්‍රම තුළින් ඇති විය හැකි වාසි හා අවාසි කිහිපයක් පහත දැක්වේ.

A - සේවකයින් අභිප්‍රේරණය වීම
B - සේවකයින් රඳවා ගැනීමට පහසු වීම
C - ආකර්ෂණ පිරිවැය අඩු වීම
D - නව දැනුම ආයතනයට ලබා ගැනීමට හැකි වීම
E - සේවකයන් අතර තරගයක් ඇති වීම
F - විශාල අයදුම්පත් සංඛ්‍යාවක් ලබා ගැනීමට හැකි වීම
G - සේවක කැපවීම වැඩි වීම
H - සේවක අනුස්ථාපන පුහුණු වියදම් වැඩි වීම

ඉහත දෑ අතුරෙන් අභ්‍යන්තර ආකර්ෂණය මගින් විය හැකි වාසි පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABCG (2) ACDG (3) BCGH (4) CEFG (5) DEFH (......)

**27.** ගුවන් නියමුවකු ලෙස පුහුණුවන්නකුට ප්‍රායෝගික පුහුණුව ලබා දීම සඳහා වඩාත් ම යෝග්‍ය පුහුණු කිරීමේ ක්‍රමය වන්නේ,

(1) දේශන හා සාකච්ඡා ය. (2) සමාකරණ පුහුණුව ය. (3) සීමාවාසික පුහුණුව ය.
(4) භූමිකා රංගනය ය. (5) ආධුනික පුහුණුව ය. (......)

[...]වැනි පිටුව බලන්න.

eHELPMATE
www.ehelpmate.com

**28.** පහත වගුවේ **X** තීරුව මගින් තොරතුරු පද්ධතියක උපාංග ද **Y** තීරුව මගින් ඊට අදාළ නිදසුන් ද දැක්වේ.

| X | Y |
|---|---|
| A. දෘඩාංග | 1. සේවක අර්ථසාධක අරමුදල් ලිපි ගොනුව |
| B. මෘදුකාංග | 2. පරිගණක ක්‍රියාකරු |
| C. ජීවාංග | 3. ක්‍රියාකාරී පද්ධතිය |
| D. දත්ත | 4. අනුමත කළ දත්ත පමණක් ඇතුළත් කිරීම |
| E. ක්‍රියාපටිපාටි | 5. යතුරු පුවරුව |

උපාංග හා නිදසුන් නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.
(1) A-1, B-3, C-2, D-4, E-5
(2) A-2, B-4, C-5, D-3, E-1
(3) A-3, B-1, C-4, D-2, E-5
(4) A-5, B-3, C-1, D-4, E-2
(5) A-5, B-3, C-2, D-1, E-4 (......)

**29.** විද්‍යුත් (ඉලෙක්ට්‍රොනික්) තාක්ෂණය උපයෝගී කරගත් ව්‍යාපාර සම්බන්ධව දැක්වෙන නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) විද්‍යුත් ව්‍යාපාර විද්‍යුත් වාණිජ්‍යයේ උපකුලකයකි.
(2) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් අලෙවිකරණය යනු එකම දෙයකි.
(3) විද්‍යුත් ව්‍යාපාර හා විද්‍යුත් වාණිජ්‍යය අතර සම්බන්ධයක් නැත.
(4) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් ව්‍යාපාර යනු එකම දෙයකි.
(5) විද්‍යුත් වාණිජ්‍යය හා විද්‍යුත් අලෙවිකරණය විද්‍යුත් ව්‍යාපාරයේ උපකුලක වේ. (......)

**30.** ව්‍යාපාර සැලසුමක අංගයක් නිවැරදිව විස්තර කෙරෙන ප්‍රකාශය තෝරන්න.
(1) තරගකාරී හා වෙළඳපොළ අත්පත් කර ගැනීමේ (විනිවිදයාමේ) උපායමාර්ග අඩංගු වන්නේ නිෂ්පාදන සැලැස්මෙහි ය.
(2) අවශ්‍ය සම්පත් ප්‍රමාණය හා නිෂ්පාදන ප්‍රමිති අඩංගු වන්නේ මෙහෙයුම් සැලැස්මෙහි ය.
(3) අවශ්‍ය මානව සම්පත අඩංගු වන්නේ මූල්‍ය සැලැස්මෙහි ය.
(4) අවශ්‍ය සියලු ම ඇස්තමේන්තුගත තොරතුරු අඩංගු වන්නේ අලෙවි සැලැස්මෙහි ය.
(5) ව්‍යාපාර උපායමාර්ග හා සංවිධාන ව්‍යුහය විස්තර කෙරෙන්නේ මානව සම්පත් සැලැස්මෙහි ය. (......)

● අංක **31** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) ශ්‍රම විභජනයෙහි ප්‍රතිඵලයක් ලෙස පුද්ගල ................................ ඇති වන අතර අතිරික්ත නිෂ්පාදන හුවමාරුව තුළින් ................................................ බිහි වේ.

(ආ) අයිතිකරුවන්ගේ වටිනාකම් හා විශ්වාසය මත සංවිධාන ................................ ගොඩනැගෙන අතර එහි නොගැළපීම සංවිධානයට ................................ වේ.

**32.** (අ) තිරසාර සංවර්ධනය මූලික කරගත් ව්‍යාපාර ආයතන විසින් ලාභය මෙන් ම ..................................... හා ............................ පිළිබඳව ද සැලකිලිමත් විය යුතු ය.

(ආ) නිෂ්පාදනයේ සිට බෙදාහැරීම දක්වා ඇති සෑම අදියරේදී ම වර්ධක අගය මත අය කරන බදු ............................................. වන අතර සේවා නියුක්තිකයෙකුගේ පාරිශ්‍රමිකය (ලාභය) මත අය කරන බදු ............................................. වේ.

**33.** (අ) කේවල ස්වාමි ව්‍යාපාරයක හිමිකරු ................................ ට තනිව මුහුණ දෙන අතර ව්‍යාපාරයේ ............................................. මත බදු ගෙවයි.

(ආ) හවුල්කරුවන්ට ව්‍යාපාරයේ වෙළෙඳ කටයුතුවලට සහභාගීවීමේ ......................... ඇති අතර ව්‍යාපාර කටයුතුවලට උනන්දුවෙන් සහභාගීවීමේ .................................... ද ඇත.

**34.** (අ) අවදානමක් දරමින් ................................ ඇති කරන පුද්ගලයා ව්‍යවසායකයකු වන අතර ඔහු සෑම විටම ................................ නොවේ.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මුදල් ................................ හැකි අතර මුදල් ............. ......................... කළ නොහැකි ය.



eHELPMATE
www.ehelpmate.com

**35.** (අ) රක්ෂණ ගිවිසුමක ක්‍රියාකාරිත්වය තුළින් මතුවන බාහිර පක්ෂය .................................. පාර්ශ්වය වන අතර සේවයේ යෙදී සිටියදී සේවකයින්ට සිදුවන අනතුරු සඳහා වන්දි ගෙවීමට සේව්‍ය පක්ෂය විසින් ලබා ගන්නා රක්ෂණය.................................... රක්ෂණය වේ.

(ආ) ප්‍රවාහන පද්ධතියට අයත් මූලිකාංග අතුරෙන් .................................... මූලිකාංගයට වරාය අයත් වන අතර දුම්රිය මාර්ගය ................................ මූලිකාංගයට අයත් වේ.

**36.** (අ) අදහසක් කිසියම් පණිවුඩයකට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය .............................. නමින් හඳුන්වන අතර පණිවුඩලාභියා විසින් එම අදහස පරිවර්තනය කරගන්නා ක්‍රියාවලිය ..................... වේ.

(ආ) මූල්‍ය සැලසුම්කරණය හා පාලනයේදී ................................ අයවැය හා ............................. අයවැය භාවිත වේ.

**37.** (අ) 'කළමනාකරණය' යන්න ගතික ව්‍යාපාර ........................................ තුළ ව්‍යාපාරයේ අරමුණු සඵලදායීව හා කාර්යක්ෂමව ඉටු කර ගැනීමට ආයතනයේ................................. මෙහෙයවීම ලෙස හැඳින්විය හැකි ය.

(ආ) අධිකාරිය ........................................... මත නීත්‍යානුකූලව ලැබෙන බලයක් වන අතර විශේෂඥ බලය ............................................. මත ලැබෙන්නකි.

**38.** (අ) අවම තොග මට්ටම = .................. මට්ටම – (සාමාන්‍ය තොග භාවිතය × සාමාන්‍ය ............... )

(ආ) මුදල් ගෙවා අපෞද්ගලිකව භාණ්ඩ හා සේවා ප්‍රවර්ධනය කිරීම ................................ වන අතර ඉලක්ක කරගත් ගනුදෙනුකරුවන් පෙළඹවීම සඳහා කරනු ලබන කෙටිකාලීන දිරිගැන්වීමේ වැඩසටහන් .............................. වේ.

**39.** (අ) දත්ත ඒවායේ ලක්ෂණ අනුව වෙන් කර ගැනීම ............................................ වන අතර අදහස් ඇති කර ගත හැකි පරිදි එම දත්ත කෙටිකර ඉදිරිපත් කිරීම................................ වේ.

(ආ) සැලසුම් සකස් කිරීමේදී විකුණුම් ප්‍රමාණය ඇස්තමේන්තු කිරීම ................................. පුරෝකථනයට ඇතුළත් වන අතර යන්ත්‍ර උපකරණ අවශ්‍යතා ................................. සැලැස්මට අයත් වේ.

**40.** පහත සඳහන් වගන්තිවල **සත්‍ය** හෝ **අසත්‍ය** බව සඳහන් කරන්න.

| | **සත්‍ය/අසත්‍ය** |
|---|---|
| 1. දැනට සිටින සාමාන්‍ය කොටස්හිමියන්ට මුදල් අයකර කොටස් ලබාදීම ප්‍රසාද කොටස් නිකුතුව වේ. | ........................ |
| 2. මුදල් අය කිරීමෙන් තොරව ලබාදෙන කොටස්, හිමිකම් නිකුතුව වේ. | ........................ |
| 3. සිය අයිතීන් රැකගැනීමට වෘත්තීය සමිති කළමනාකාරිත්වය සමග සාකච්ඡා කිරීම සාමූහික කේවල් කිරීම වේ. | ........................ |
| 4. සාමූහික කේවල් කිරීමේ ක්‍රියාවලියකින් පසු යම්කිසි ආරවුලක් සම්බන්ධව සේව්‍ය සේවක දෙපාර්ශ්වය අතර ඇති කරගන්නා එකඟතාව සාමූහික ගිවිසුම වේ. | ........................ |

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

**41.** පහසු භාණ්ඩවල ගුණාංග **හතරක්** ලියන්න.

1. ............................................. 2. .............................................

3. ............................................. 4. .............................................

**42.** ඇල්මැති පාර්ශ්වකරුවෙකු ලෙස රජය, පාසල් කෙරෙහි අවධානය යොමු කිරීමට බලපාන හේතු **හතරක්** ලියන්න.

1. ............................................. 2. .............................................

3. ............................................. 4. .............................................

**43.** පාරිභෝගිකයා සතු වගකීම් **හතරක්** සඳහන් කරන්න.

1. ............................................. 2. .............................................

3. ............................................. 4. .............................................

[ඉහවැනි පිටුව බලන්න.

eHELPMATE
www.ehelpmate.com

**44.** විද්‍යුත් (ඉලෙක්ට්‍රොනික්) ගෙවීම් පහසු කිරීම සඳහා ඇති පහසුකම් **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**45.** චෙක්පත් ලිවීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු **හතරක්** ලියන්න.

1. .......... 2. ..........

3. .......... 4. ..........

**46.** ජාත්‍යන්තර වෙළඳාමෙහි වර්ධනයට බලපා ඇති කරුණු **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**47.** පාලන ක්‍රියාවලියක් ආයතනයකට වැදගත් වන හේතු **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**48.** සන්නමකින් යුතුව භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමෙන් නිෂ්පාදකයෙකුට ලැබෙන වාසි **හතරක්** ලියන්න.

1. ..........
2. ..........
3. ..........
4. ..........

**49.** සාමාන්‍ය කොටස් හිමියෙකු වෙත ලාභාංශවලට අමතරව සමාගමකින් ලැබෙන ප්‍රතිලාභ **හතරක්** ලියන්න.

1. .......... 2. ..........

3. .......... 4. ..........

**50.** පහත සඳහන් සංකේතවලින් අදහස් කෙරෙන්නේ කුමක් ද?

1.  ..........

2.  ..........

3.  ..........

4.  ..........

* * *

HELPMATE
www.ehelpmate.com

58486

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2018 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2018 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2018**

**ව්‍යාපාර අධ්‍යයනය II**
**வணிகக் கல்வி II**
**Business Studies II**

**32 S II**

2018.08.13 / 1300 - 1610

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) (අ) අවශ්‍යතා, වුවමනා සහ නිෂ්පාදිත යන පද නිර්වචනය කර, ඒවා අතර පවතින සම්බන්ධතාව පැහැදිලි කරන්න.
(ආ) නිෂ්පාදන ක්‍රමය සෘජු නිෂ්පාදනයේ සිට වක්‍ර නිෂ්පාදනය දක්වා මාරු වීමට බලපෑ ප්‍රධාන හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(ii) (අ) නව පරපුර කෘෂිකර්මාන්තයේ නියුක්ත වීමට අකමැත්තක් දක්වනු ලැබේ. මෙසේ වීමට බලපා ඇති හේතු **හතරක්** දක්වන්න.
(ආ) සාර්ව පරිසරයේ දැකිය හැකි විශේෂ ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(iii) ගෝලීයකරණය යනු කුමක් දැ'යි අර්ථකථනය කර, එය දේශීය ව්‍යාපාර කෙරෙහි ඇති කරන ධනාත්මක හා සෘණාත්මක බලපෑම් **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'සංවිධාන සංස්කෘතිය' යන්න අර්ථකථනය කරන්න.
(ආ) සංවිධාන සංස්කෘතිය තුළ ඇති ශක්තියක් හා දුර්වලතාවයක් එක් උදාහරණය බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) ව්‍යාපාර සමාජ වගකීම් යනු කුමක් දැ'යි පැහැදිලි කර, වර්තමාන සමාජය තුළ එය වැදගත්වීමට හේතු **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

2. (i) ආහාර ද්‍රව්‍ය නිෂ්පාදකයෙකු සිය නිෂ්පාදනවල ගුණත්වය තහවුරු කිරීම සඳහා ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේදී, ඔහු විසින් සැලකිල්ලට ගත යුතු සාධක **හතරක්** සඳහන් කර, එම සාධක සැලකිල්ලට ගත යුත්තේ ඇයි දැ'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) කෘෂි නිෂ්පාදන සඳහා පනවනු ලබන ආනයන බදු තුළින් බලපෑම් ඇති වන පාර්ශ්ව **හතරක්** නම් කර, එමගින් එක් එක් පාර්ශ්වයට ලැබෙන වාසි **එක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාර සාර්ථකව කරගෙන යාමට රජයක් විසින් විවිධාකාරයෙන් මැදිහත්වීම් සිදු කරනු ලැබේ. එසේ මැදිහත්වීමේ ක්‍රම **හතරක්** දක්වා, එම එක් එක් ක්‍රමය තුළින් රජයක් අපේක්ෂා කරන්නේ කුමක් දැ'යි විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) හවුල්කරුවන් අතර ආරවුල් හටගැනීමට බලපානු ලබන කරුණු **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
(ආ) ජනතාවට අවශ්‍ය නිෂ්පාදිත රාජ්‍ය ආයතන තුළින් ලබා දීමට රජය විසින් කටයුතු කරනු ලැබේ. එවැනි රාජ්‍ය ආයතන වර්ග **හතරක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(v) වරලත්හිමියාට මෙන් ම වරලත්ලාභියාට ද ඉටු කළ යුතු කාර්ය සමූහයක් පවතී. වරලත්ලාභියකු විසින් ඉටු කළ යුතු කාර්ය **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

eHELPMATE
www.ehelpmate.com

3. (i) රැකියාවක් කිරීමට වඩා තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට ඔබගේ මිතුරෙකුට කැමැත්තක් පවතින නමුත් ඔහු තුළ ඒ සඳහා බියක් ද පවතී. රැකියාවක් කිරීමට වඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ වාසි ඔහුට පැහැදිලි කිරීමට කරුණු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) ව්‍යවසායකයින් විශාල වශයෙන් රටකට අවශ්‍ය වුවත් ඔවුන් බිහිවන්නේ සුළු වශයෙනි. එසේ සුළු වශයෙන් ව්‍යවසායකයින් බිහිවීමට බලපානු ලබන සාධක **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) බොහෝ රටවල මහා පරිමාණ ව්‍යාපාරවලට වඩා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංඛ්‍යාව විශාල වේ. එම සංඛ්‍යාව ඉහළ යාමට බලපානු ලබන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට ආවේණික වූ ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) මූල්‍ය සමාගම් ව්‍යාපාර සංවර්ධනය සඳහා විවිධ සේවා සපයයි. ව්‍යාපාරවලට මූල්‍ය සමාගම් මගින් සපයන සේවා **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) "විද්‍යුත් මුදල් භාවිතය තුළින් වාසි මෙන් ම අවාසි ද සිදු වේ." මෙම ප්‍රකාශය විද්‍යුත් මුදල් භාවිතයේ වාසි හා අවාසි **දෙක** බැගින් දක්වමින් තහවුරු කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) රක්ෂණය කළ **නොහැකි** අවදානම් **හතරක්** සඳහා උදාහරණ සපයන්න.

(ආ) රක්ෂණ කර්මාන්තයේ සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය පිහිටුවා ඇත. මෙම මණ්ඩලය මගින් ඉටු කරන කාර්ය **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) නුවරඑළියේ සිට කොළඹට පලතුරු ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රවාහන සේවාවක් තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු ප්‍රධාන කරුණු **හතරක්** දක්වන්න.

(ආ) දුම්රිය මගින් භාණ්ඩ ප්‍රවාහනය වර්ධනය කරලීම සඳහා ඔබ විසින් කරන යෝජනා **හතරක්** හේතු සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) කළමනාකරණ සහකරුවන් සඳහා පැවැත්වූ පුහුණු සැසියකදී ලිපි ගොනු පවත්වා ගැනීම පිළිබඳ ඔබගේ දේශනයට සහභාගිවූවන්ගේ ප්‍රතිචාරය හොඳ මට්ටමක නොමැති බව කළමනාකාරිත්වය විසින් දන්වා ඇත. එවැනි ප්‍රතිචාරයක් ලැබීමට ඔබගේ දේශනයේදී සිදු විය හැකි දුර්වලතා **හතරක්** සඳහන් කරන්න.

(ආ) බොහෝ ආයතන සන්නිවේදන කටයුතු සඳහා විද්‍යුත් තැපැල භාවිත කරනු ලැබේ. විද්‍යුත් තැපැල භාවිත කිරීමේ වාසි හා අවාසි **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) සාම්ප්‍රදායික සිල්ලර වෙළෙඳසැල් සඳහා සුපිරි වෙළෙඳසැල්වලින් දැඩි තර්ජනයක් පවතී. සුපිරි වෙළෙඳසැල් වෙත පාරිභෝගිකයින් වැඩි වශයෙන් ආකර්ෂණය වීමට හේතු **හතරක්** විස්තර කරන්න.

(ආ) ඇතැම් ශ්‍රී ලාංකික ව්‍යාපාරිකයින්ට ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ ඇති තරගකාරිත්වයට මුහුණදීමට නොහැකි ය. එසේ නොහැකි වීමට හේතු වන ව්‍යාපාරිකයකුට පාලනය කළ හැකි සහ පාලනය කළ නොහැකි සාධක **දෙක** බැගින් ලියන්න. (ලකුණු 04 යි)

(v) (අ) 'ගනුදෙනු කළ නොහැක' යන රේඛනය යෙදීමෙන් අණකරුට විශේෂිත වූ වාසියක් හිමි නොවේ. මෙම අදහසට ඔබ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

(ආ) විද්‍යුත් වෙළෙඳාම (e-trade) ප්‍රචලිත වීමට බලපා ඇති කරුණු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

## II කොටස

5. (i) (අ) "අන් අය ලවා වැඩ කරවා ගැනීමේ කලාව කළමනාකරණය වේ." මෙම නිර්වචනය පැහැදිලි කරන්න.

(ආ) පසුගිය සතියේ ඔබේ පාසලේ පැවති වාණිජ දිනය සංවිධානය කිරීමේ කණ්ඩායමෙහි ඔබ ද සාමාජිකයකු විය. එම දිනය පැවැත්වීම සඳහා ඔබ කණ්ඩායම විසින් ඉටු කරන ලද කාර්ය **හතරක්** උදාහරණ ලෙස යොදා ගනිමින් කළමනාකරණ ශ්‍රිත විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) කළමනාකරුවකුගේ සංකල්පනාත්මක කුසලතා යන්නට ඇතුළත් වන හැකියා **හතරක්** සඳහන් කරන්න.

(ආ) හෙන්රි මින්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකාවල **නායකයා** සහ **ව්‍යවසායකයා** යන උප භූමිකාවලට අයත් කාර්ය විස්තර කරන්න. (ලකුණු 04 යි)



HELPMATE
www.ehelpmate.com

(iii) ව්‍යාපාර උපදේශන සමාගමක් විසින් ඔබට නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා නව සූර්ය බලශක්ති පද්ධතියක් හා නිෂ්පාදනාගාර ස්වයංක්‍රියකරණය කිරීමේ පද්ධතියක් යෝජනා කර ඇත. මෙම විකල්පවලින් එකක් තෝරා ගැනීමට ඔබ අදහස් කරන අතර ඒ සඳහා මෙම විකල්ප ඇගයීමට යොදාගත හැකි නිර්ණායක **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) සංවිධානකරණයේ පියවර නම් කර, ඉන් පියවර **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) පිරියත සැලැස්මක් අවශ්‍ය වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.

(ආ) වෙළෙඳ ආයතනයක මූල්‍ය විග්‍රහයේදී අනාවරණය වූයේ ආයතනය අනවශ්‍ය ලෙස තොග පවත්වා ගැනීම නිසා පාඩු සිදුවී ඇති බවයි. එවැනි පාඩු අවම කර ගැනීම සඳහා තොග පාලනයේදී අනුගමනය කළ හැකි උපක්‍රම **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

6. (i) (අ) ව්‍යාපාරයකට ඵලදායීතාවය වැදගත් වන්නේ ඇයි දැ'යි යන්න දැක්වීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

(ආ) ව්‍යාපාරයක ඵලදායීතාවය වැඩි කිරීමට යොදා ගනු ලබන පරිගණක ශිල්පීය ක්‍රමයක් වන 'පරිගණක ආධාරක නිර්මාණකරණය' (CAD) යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි දක්වා එහි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න. (ලකුණු 04 යි)

(ii) ඉන්ද්‍රපාල තම ප්‍රදේශයේ පැවැත්වූ අලුත් අවුරුදු පොළෙහි වෙළෙඳ කුටියක් කුලියට ගත් අතර, ඔහුගේ භාණ්ඩ සියල්ල ඒ හා සමාන භාණ්ඩ විකුණූ අනෙක් වෙළෙඳ කුටිවලට වඩා ඉක්මනින් අලෙවි විය. ඉන්ද්‍රපාලගේ වෙළෙඳ කුටියේ භාණ්ඩ සියල්ල ඉක්මනින් අලෙවි වීමට හේතු විය හැකි කරුණු **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) නිෂ්පාදකයකු තම භාණ්ඩවලට ඇසුරුමක් යෙදීමට මැලිකමක් දක්වයි. ඇසුරුමකින් යුක්තව තම භාණ්ඩ වෙළෙඳපොළට ඉදිරිපත් කිරීම සඳහා නිෂ්පාදකයා උනන්දු කිරීම සඳහා යොදා ගත හැකි කරුණු **හතරක්** සඳහන් කරන්න.

(ආ) භාණ්ඩ හා සේවා මිල කිරීමේ අරමුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) විවිධ අරමුණු සඳහා ව්‍යාපාර විසින් ප්‍රචාරණය භාවිත කරනු ලැබේ. ප්‍රචාරණයේ අරමුණු **හතරක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) (අ) ධනසිරි විසින් කරගෙන යනු ලබන අත්යන්ත්‍ර රෙදිපිළි ව්‍යාපාරය එතරම් සාර්ථක නොවන බැවින් ඔහු හෝටලයක් ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ඔහුට අරමුදල් සපයා ගත හැකි මාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) නාමල්ගේ ව්‍යාපාරයේ ක්ෂණික අනුපාතය 2 : 1 වේ. මෙම තත්ත්වය ඇති වීමට බලපෑ හේතු **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

7. (i) (අ) ව්‍යාපාරයකට කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයා ගත හැකි මාර්ග **හතරක්** සඳහන් කරන්න.

(ආ) කොළඹ කොටස් හුවමාරුව තුළින් ලැයිස්තුගත සමාගමකට ලැබිය හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) මානව සම්පත් කළමනාකරුවෙකු වශයෙන් ඔබ සේවය කරන ආයතනයට අලෙවි සහකරුවන් බඳවා ගැනීම සඳහා පිළියෙල කරන අයදුම්පත්‍රයක ඇතුළත් විය යුතු තොරතුරු වර්ග **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) රැකියාවකට අයදුම්කරුවකු තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට අමතරව විවිධ පරීක්ෂණ පවත්වනු ලබයි. එසේ පවත්වනු ලබන පරීක්ෂණ ක්‍රම **දෙකක්** විස්තර කරන්න.

(ආ) පත්වීම් ලිපියක අඩංගු තොරතුරු වර්ග කළ හැකි ආකාර **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(iv) පාඩු ලබන ආයතනයක් තම සේවක සංඛ්‍යාව අඩු කිරීමට අදහස් කරයි. එසේ සේවක සංඛ්‍යාව අඩු කළ හැකි ක්‍රම **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) පහත දැක්වෙන්නේ ආයතනයක වෙළෙඳ ගිණුමෙන් උපුටාගත් දත්ත කිහිපයකි.

| | රු. | රු. |
|---|---|---|
| විකුණුම් | | 500 000 |
| ආරම්භක තොගය | 80 000 | |
| ගැනුම් | 300 000 | |
| | 380 000 | |
| අවසාන තොගය | (120 000) | 260 000 |

ඉහත දත්ත ඇසුරෙන් ලබා ගත හැකි තොරතුරු **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ හතරවැනි පිටුව බලන්න

HELPMATE
www.ehelpmate.com

**8.** (i) (අ) තොරතුරු කළමනාකරණ තාක්ෂණය යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැ'යි විස්තර කරන්න.
(ආ) තොරතුරු තාක්ෂණය භාවිතයෙන් ආයතනයකට ලබා ගත හැකි වාසි **හතරක්** විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) ව්‍යාපාරිකයෙක් තම ව්‍යාපාර කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කිරීමට අදහස් කරයි. අන්තර්ජාලය භාවිත කිරීමෙන් ඔහුගේ ආයතන කටයුතු පහසු කර ගත හැකි ආකාර **හතරක්** විස්තර කරන්න.
(ආ) වලාකුළු (CLOUD) තාක්ෂණය භාවිත කිරීමෙන් ආයතනයකට ලබාගත හැකි වාසි **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ව්‍යාපාර සැලැස්මේ අලෙවි සැලසුමට ඇතුළත් කළ යුතු ප්‍රධාන උපාය මාර්ග මොනවා ද? (ලකුණු 04 යි)

(iv) මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් සකස් කිරීමේ වැදගත්කම පැහැදිලි කිරීමට කරුණු **දෙකක්** දක්වා, ව්‍යාපාරයක මුදල් ගලායාමට අදාළ අයිතම **තුනක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) සමන් දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයට අමතරව සත්ත්ව ගොවිපළක් ආරම්භ කිරීමට අපේක්ෂා කරයි. ඒ සඳහා ව්‍යාපෘති වාර්තාවක් සකස් කිරීමට ඔබට බාර දී ඇත. එම ව්‍යාපෘති වාර්තාවේ සාරාංශය තුළ ඔබ විසින් ඇතුළත් කරනු ලබන්නේ මොනවා දැ'යි සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *

eHELPMATE
www.ehelpmate.com